# පරිසර සම්පත් රැක ගත යුත්තේ ඇයි?

වන ජීවීන් අපේ සම්පතකි. ඉතා ඉහළ ජෛව විවිධත්වය හා අධික ආවේණික ජීවී ප්‍රතිශතය නිසා අප රටෙහි ජෛව සම්පත්වලට සුවිශේෂ තැනක් හිමිවී තිබේ. මෙම සුවිශේෂී ගුණාත්මක වටිනාකම අපේ පරිසර සම්පත් දේශීය හා විදේශීය ජාවාරම්කරුවන්ගේ ඉලක්ක බවට පත්වීමට හේතු වී ඇත. මෙහි ප්‍රතිඵලය පාලනයකින් තොරව පරිසර සම්පත් පිටරට ඇදී යාමයි. මෙම නව තර්ජනය එල්ල වී ඇත්තේ අපේ වන සතුන්, පැළෑටි සහ ආශ්‍රිත සම්පත් වලට ඇති අනෙකුත් තර්ජනයන් වන වනාන්තර විනාශය හා වාසස්ථාන අහිමිවීම, මහා වාරිමාර්ග යෝජනා ක්‍රම, කෘෂි රසායනික ද්‍රව්‍ය, ස්වභාවික පරිසරයට හඳුන්වාදුන් විදේශීය ශාක හා සත්ත්ව විශේෂ, ස්වභාවික දේශගුණික හා කාලගුණික විපර්යාස ආදී සාධකයන්ට අමතරවය. එමනිසා පරිසර සම්පත් ධරණීය ආකාරයෙන් පරිහරනය කිරීමත්, මතු පරපුර වෙනුවෙන් ආරක්ෂා කිරීමත් අපගේ යුතුකමකි.

රේගුව මගින් නීති විරෝධී ආනයනයන් සහ අපනයනයන් අත්අඩංගුවට ගෙන වරදකරුවන්ට දඬුවම් දීම සිදුකළත් මේ වන විටත් මහා පරිමාන පරිසර හානි සිදුවී හමාර බව මෑත කාලයේ රේගු අත් අඩංගුවට ගැනීම් පිළිබඳව ජනමාධ්‍ය මගින් දැක ඇති විස්තර අනුව ඔබට වටහාගත හැක. වඩාත් ඵලදායක වන්නේ මෙම ජාතික සම්පත් අදාල පරිසරයේදීම ආරක්ෂා කර ගැනීමයි.






වඳවියාමේ තර්ජනයට භාජනය වී ඇති මත්ස්‍යයෙකි බුලත්හපයා. බලපත්‍ර රහිතව අපනයනයට තැත්කිරීමේ දී, රේගු අත්අඩංගුවට පත්වූ අවස්ථාවක්

ඡායාරූපය: සමන්ත ගුණසේකර

මේ සම්බන්ධයෙන්

**ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව**

ගෙන යන නව වැඩ පිළිවෙළෙහි
තවත් ඉදිරි පියවරක් ලෙස මේ අයුරින්
ඔබ හමුවට පැමිණීම හඳුන්වාදිය හැක.






ව්‍යාජ ප්‍රකාශනයක් මගින් අපනයනයට උත්සාහ කළ දුර්ලභ, අපනයනය තහනම් "වෙස්මුහුණු රුවල්කාරයින්" රේගු අත්අඩංගුවේදී.

චිත්‍ර නිර්මාණය: ප්‍රසන්න වීරක්කොඩි



රේගු අත්අඩංගුවට පත්වූ ඇත්දළ ඇතුළු සත්ත්ව කොටස් තොගයක්



රේගු අත්අඩංගුවට පත්වූ වඳවීයාමේ තර්ජනයට භාජනය වූ සංරක්ෂිත කෘමීන් තොගයක්









පර්යේෂණ වලට මුවා වී අපේ ඖෂධ ශාක නිස්සාරක රට පටවා ඒවා අනුසාරයෙන් ලබාගත් නිෂ්පාදන වලට අද විවිධ රට වලදී පේටන්ට් බලපත්‍ර පවා ලබාගෙන ඇත. මෙය මෙම වර්ගයේ මෙතෙක් එකම රේගු අත්අඩංගුවට ගැනීම වන්නට පිළිවන.









අතිශයින් දුර්ලභ "රතු ගල්පර පොකිරිස්සා" වන සත්ත්ව සහ වෘක්ෂලතා ආරක්ෂක පනත යටතේ ආරක්ෂිතය. හොර රහසේ අපනයනයට තැත් කිරීමේ දී, රේගු අත්අඩංගුවට පත්වූ අවස්ථාවක්